**මිනිපේ ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිල්හත සුසාන භූමිය පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩමේ වටිනාකම තක්සේරු කර 2021 වර්ෂයට ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | 2020 ජනවාරි 16 දින මිලදී ගෙන ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබූ රු.180,000 ක් වටිනා වල් කපන මැෂිම (Rotary Slasher) මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.59,598,498 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.2,082,649 ක වෙනසක් පැවතුණි. | 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.95,074,409 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි 11 ක් ස්ථාවර වත්කම් ලේඛනය තුළ රු.92,037,016 ක් ලෙස දැක්වීමෙන් රු.6,043,288 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් පිළිබඳ පරීක්ෂා කර බලා ඉදිරියේදී ඔබ වෙත වාර්තා කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපලේඛන හා තහවුරු කිරීමේ ලියවිලි ඉදිරිපත් නොකිරීමේ හේතුවෙන් එකතුව රු.7,051,397 ක් වූ ගිණුම් විෂයයන් 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | නිරවුල් කර ගැනීමට නොහැකි වී ඇති ශේෂ මහා සභා අනුමැතිය ගෙන කපා හැරීම සඳහා කටයුතු කරන අතර අනෙකුත් ගිණුම් ශේෂ තහවුරු කිරීමට උපලේඛන පිළියෙල කර ඉදිරිපත් කරමි. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි571 (2) | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉකුත් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් එකතුව රු.1,701,577 ක් වූ තැන්පතු 28 ක් වසර 2 කට වැඩි කාලයක් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | මෙම අඩුපාඩු නිවැරදි කර ඔබ වෙත ඉදිරිපත් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,225,811 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,316,477 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අයවිය යුතුව තිබූ රු.1,134,608 ක හිඟහිටි වරිපනම් බදු ශේෂයෙන් රු.1,012,335 ක් හා සමාලෝචිත වර්ෂයේ බිල්කළ රු.1,333,672 ක වරිපනම් බදු වටිනාකමින් රු.685,033 ක් ලෙස එකතුව රු.1,697,368 ක් අය කරගෙන නොතිබුණි. | ආදායම් පරීක්ෂක තනතුරු දෙකක් පුරප්පාඩු පැවතීම හා මාර්තු මාසයේ ලොව තුළ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය මන්දගාමීව පැවතුණි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | **කඩ කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.6,907,199 ක හිඟ කඩ කුලී ශේෂයෙන් රු.6,811,673 ක් හා සමාලෝචිත වර්ෂයේ බිල්කළ රු.2,665,865 ක කඩ කුලී වටිනාකමින් රු.2,331,193 ක් ලෙස එකතුව රු.9,142,866 ක් අය කරගෙන නොතිබුණි. | සභාව සතු වෙළඳසැල් වලින් අයවිය යුතු හිඟ කඩ කුළී අය කර ගැනීම සඳහා නඩු පැවරීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | 2015 සැප්තැම්බර් 04 දින නඩු තීරණය මඟින් 2008 වර්ෂයේ සිට වැලි තොටුපලින් අය විය යුතුව තිබූ රු.81,949 ක ශේෂය අයකර ගැනීමට තීන්දුව ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් රු.71,933 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රමාද වුවහොත් නීතිමය වශයෙන් කටයුතු කරමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති ජල ගාස්තු හිඟයෙන් රු.1,550,686 ක් ද වර්ෂයේ බිල් කිරීම් වලින් රු.1,928,437 ක් ද ලෙස එකතුව රු.3,479,122 ක් අයකර ගෙන නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය පහව ගිය පසු හිඟ ජල ආදායම් රැස්කර ඔබ වෙත වාර්තා කරමි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් හා අනෙකුත් ආයතනවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.4,277,860 ක් හා මුද්දර ගාස්තු රු.913,945 ක් අයකර ගෙන නොතිබුණි. | ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.59,078,700 ක් වැය කර ඉදිකල බහුකාර්ය ගොඩනැගිල්ලේ මහජන පුස්තකාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, සෞඛ්‍ය මධ්‍යස්ථානය , මාතෘ හා ආයුර්වේද මධ්‍යස්ථානය හා ප්‍රජා ශාලාව යනාදිය ස්ථාපිත කිරීමට යෝජනා කර තිබුණද, පළමු මහල කාර්යාල පරිශ්‍රය සඳහා භාවිතයට ගෙන තිබුණු අතර මෙම ගොඩනැගිල්ලෙහි බිම් මහලේ හා දෙවන මහලේ වර්ග අඩි 14000 ක ප්‍රමාණය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම වසරේ එම බිම් කොටස් කුලී පදනම මත ලබා දී සභාවට ආදායම් ලබා ගැනීමට අපේක්ෂා කරමි. | කඩිනමින් ඵලදායී කටයුත්තකට යොදාගත යුතු බව. |

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති, නිවාස කුළී, ජල ගාස්තු, කඩ කුළී හා අය කිරීමට තිබෙන දඩ යන ගිණුම් ශේෂ 5 ක එකතු වටිනාකම රු.58,748,541 ක් වූ අතර ඒ තුළ වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ එකතුව රු.7,655,824 ක ගිණුම් ශේෂ හා වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ එකතුව රු.3,005,501 ක ගිණුම් ශේෂ ඇතුළත්ව තිබූ නමුත් එම ශේෂ අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ එකතුව රු.800,154 ක් ද වසර 1 ත් - 5 ත් අතර එකතුව රු.334,873 ක් ද ලෙස එකතුව රු.47,103,359 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි. | මෙම ශේෂයන් සොයා බලා ඔබ වෙත වාර්තා කිරීමට කටයුතු කරමි. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලයේ තනතුරු 9 ක පුරප්පාඩු 15 ක් සඳහා බඳවා ගැනීම් කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |